සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019(II)**

**කාලය: පැය 03**

**අපරාධ නීතිය හා සාක්ෂි නීතිය (01-III)**

විභාග අංකය
Index No / சுட்டெண்
.................................

- **ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**

---

1. i. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ආයතන සංග්‍රහය රජයේ සේවකයා යන්නට අර්ථ නිරූපණ සපයා ඇත. මින් දණ්ඩ නීති සංග්‍රහය අනුව "රජයේ සේවකයා" යන්න අර්ථ නිරූපණය කර ඇති ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

   ii. ඉහත දණ්ඩ නීති සංග්‍රහයේ "රජයේ සේවකයා" යන නිර්වචනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ ආයතන සංග්‍රහයේ රාජ්‍ය සේවකයා යන අර්ථ නිරූපණය කර ඇති ආකාරයෙන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

2. ලේඛනගත සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කිරීමේදී එම සාක්ෂි ප්‍රාථමික සාක්ෂියක් ලෙස ඉදිරිපත් කරන අවස්ථා සහ ද්වීතියික සාක්ෂියක් ලෙස ඉදිරිපත් කරන අවස්ථා දැකිය හැකිය. ප්‍රාථමික ලේඛනගත සාක්ෂි හා ද්වීතියික ලේඛනගත සාක්ෂි පිළිබඳ සවිස්තරව විස්තර කරන්න. (ලකුණු 20)

3. A විජිතපුර ප්‍රාදේශීය ලේකම්වරයාය. එක් රාජකාරි දිනකදී මාංචු දමන ලද ඉඩම් අංශයෙහි විෂය භාර කළමනාකරණ සේවා නිලධාරී B ද සමග සිවිල් ඇඳුමෙන් සිටි පුද්ගලයින් පිරිසක් A ගේ නිල කාමරය තුළට පැමිණියේය. C ගෙන් අල්ලස් ලබාගැනීම සම්බන්ධව B අත්අඩංගුවට ගන්නා බව එම පුද්ගලයින් විසින් පවසන ලදී. එම පුද්ගලයින් ඔවුන්ගේ නිල හැඳුනුම්පත් පෙන්වා දෙමින් ඔවුන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් බව වැඩිදුරටත් පවසන ලදී. C සම්බන්ධ වන කලක් පවතින ඉඩම් ආරවුලක් ඇති බව ද A ට මේ අවස්ථාවේදී මතකයට නැගුනි. කොමිෂන් සභාවේ නිලධාරීන් A ගෙන් ප්‍රකාශයක් ලබාගත් අතර, පසුව කොමිෂන් සභාවට ද කැඳවා C ගෙන් සහ B අල්ලස් ගන්නා අවස්ථාවේදී එම ස්ථානයේම සේවය කළ සමාජ සේවා විෂය භාර කළමනාකරණ සේවා නිලධාරී D ගෙන් ද මෙලෙස ප්‍රකාශ ලබාගෙන ඇත.

   i. අධිකරණ කටයුත්තකදී කොමිෂන් සභාව විසින් පැමිණිල්ල සඳහා සාක්ෂි ලෙස A, B, C හා D යන අයවලුන්ගෙන් කවර පුද්ගලයින් පැමිණිල්ලේ සාක්ෂි ලෙස යොදාගත හැකිද? විස්තර කරන්න. (ලකුණු 12)

   ii. ඇසින් දුටු සාක්ෂි ලෙස A, B, C, D යන අයගෙන් කවර අයවලුන් පැමිණිල්ලේ සාක්ෂි ලෙස යොදාගත හැකිද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ මනුෂ්‍ය ශරීරය සම්බන්ධ වැරදි හා ජීවිතය සම්බන්ධ වැරදි යටතේ එන පහත සඳහන් වැරදිවලින් 04ක් සම්බන්ධව කෙටි සටහන් ලියන්න.

i. මිනීමැරීම
ii. සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය
iii. ස්ත්‍රී දූෂණය
iv. අපහරණය
v. පැහැරගෙන යාම
vi. සාපරාධී බලහත්කාරය
vii. තුවාල කිරීම
viii. ගබ්සා කිරීම (ලකුණු 5X4 = 20)

5. A සමගිපුර ප්‍රදේශයේ තරුණයෙකි. ටික කලක් ගමින් පිටව ගොස් සිටි A නැවත ගමට පැමිණ පවසා සිටියේ ඔහු ගමේ නොසිටි කාලයේදී පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ලැබූ බවත් ලඟදීම ප්‍රදේශයෙහි පොලිස් ස්ථානයට පත්වීමක් ලබා පැමිණීමට නියමිත බවත්ය. මෙම ප්‍රකාශය අසා සිටි B විසින් තමන්ට අදාළ පොලීසියේ රාජකාරියක් සිදුකර ගැනීමට ඇති බව පවසා A වෙත වටිනා විදෙස් මත්පැන් බෝතලයක් ලබාදුනි. මෙහිදී A, B ගේ අවශ්‍යතාවය ඉටුකර දීමට පොරොන්දු වී අදාළ තුටු පඬුර ලබාගනී. නමුත් සත්‍ය වශයෙන්ම A පොලිස් විද්‍යාලයේ පුහුණුවක් නොලැබූ අතර, ඔහු පොලීසියෙහි කිසිදු නිලයක්ද නොදරයි.

දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් රජයේ සේවකයෙකු නිල ක්‍රියාවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල රජයට අයකර ගතයුතු ගාස්තුවක් හෝ ලැබීමක් හැර වෙනත් තුටු පඬුරක් ලබාගැනීම සම්බන්ධ නම් වරද විස්තර කරමින් ඉහත A විසින් එම වරද සිදුකර තිබේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 20)

6. සාක්ෂි ආඥා පනත අනුව පහත සඳහන් කරුණු අතරින් 04 ක් සඳහා කෙටි සටහන් ලියන්න.

i. වරද කියා පෑම (Admissions)
ii. ඒත්තු ගැන්වීම (Confessions)
iii. කරුණු (Facts)
iv. සාක්ෂි විමසීමේ පිළිවෙළ
v. විශේෂඥ සාක්ෂි (ලකුණු 5X4 = 20)

**************